# ඩී බී කුරුප්පු ශූරීන්ගේ තවත් පොත් දෙකක් නිකුත් වෙයි




ප්‍රවීණ ගත්කරු ඩී බී කුරුප්පු ශූරීන් ගේ තවත් පොත් දෙකක් පසුගියදා ප්‍රකාශයට පත්විය. මේ පොත් දෙකින් "සැඳෑ තරු එළියේ කිමිදෙන හිරු" එතුමන්ගේ ජීවන අත්දැකීම් අළලා ලියැවෙන පොත් පෙළේ තුන්වන කෘතියයි. දෙවන කෘතිය වන "පිරිමි ජාතිය උතුම් ජාතිය" ඔහු විසින් ලියන ලද ලිපි එකතුවකි.



"සැඳෑ තරු එළියේ කිමිදෙන හිරු" තමන්ගේ ජීවන අත්දැකීම් පොත් පෙළේ අවසන් කෘතිය යයි එහි පෙරවදනේ කුරුප්පු මහතා සඳහන් කරයි.
"මට තව ඉදිරි ගමනක් නැත මට දැන් ඇත්තේ මගේ ජනේලයෙන් පෙනෙන දර්ශනය හා අතීතාවර්ජනය පමණි ඒ දෙක ම මට මිහිරි ය" ඔහු සිය ජීවන අත්දැකීම් ලියා අහවර කරන්නේ එසේ ය.

"පිරිමි ජාතිය උතුම් ජාතිය" කෘතියේ කුරුප්පු මහතා වරින් වර විවිධ මාතෘකා ඔස්සේ ලියන ලද ලිපි අටක් ඇතුළත්ව ඇත. කෘති දෙක ම ප්‍රකාශයට පත් කර ඇත්තේ එතික ප්‍රකාශය ආයතනයි.

**මේ පොත් දෙක සහ ඩී බී කුරුප්පු ශූරීන් අතින් මෑතදී ලියැවුණ අනෙක් පොත් හඳුන්වාදීමේ සුහද හමුවක් ළඟදීම පැවැත්වෙයි. ඒ පිළිබඳ විස්තර බලාපොරොත්තුවන්න.**




